## Abstract 32

# පටිමාඝරයන්හි වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක්

**සචිනි කුෂානි දේවසිරි නාරායන,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*sachinikushani@gmail.com*

**පටිමාඝර** යනු බෞද්ධ ගෘහනිර්මාණ සම්ප්‍රදාය තුළ බුද්ධ ප්‍රතිමාවක් ආවරණය කිරීම සඳහා නිර්මිත ගෘහයකි. ක්‍රි. ව. 5 වන සියවස පමණ වන විට බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ ඇති වූ සංවර්ධන අවස්ථා හේතුවෙන් මෙම පටිමාඝර නිර්මාණය කිරීම ආරම්භ වූ බව සැලකේ. පටිමාඝරයන්හි අන්තර්ගත **ප්‍රතිමා, සිතුවම්** හා **කැටයම්** ආදිය හේතුවෙන් එය කලාත්මක නිර්මාණයක් වශයෙන් ඇගයීමට භාජනය විය. පටිමාඝරයන්හි ආරම්භය, ඉතිහාසය හා විකාශය පිළිබඳවත්, ඒවායෙහි ඇතුළත් වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මෙන් ම කලාත්මක වටිනාකම පිළිබඳව අධ්‍යයනය කිරීමත් අරමුණ වේ. විශේෂයෙන් නටබුන් අතර කැපී පෙනෙන අංගයක් වන පටිමාඝරවල ගෘහනිර්මාණ ශිල්පය හා සෞන්දර්යාත්මක ජීවගුණය සම්බන්ධයෙන් නිවැරදි අවබෝධයක් ලබා දීම මෙයින් අපේක්ෂිත ප්‍රතිඵලය වේ. එපමණක් නොව පටිමාඝර ඉදිකිරීම සම්බන්ධ ඓතිහාසික පසුබිම හා ඒ පිළිබඳව පවතින බෞද්ධ විග්‍රහය හඳුනා ගැනීම ද මෙහි තවත් ප්‍රතිඵලයකි. පටිමාඝරයන්හි වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක ලක්ෂණ අධ්‍යයනය කිරීම සඳහා සාහිත්‍යමය මූලාශ්‍රය භාවිත කෙරෙන අතර එහි දී ප්‍රාථමික මූලාශ්‍රය මෙන් ම ද්විතීයික මූලාශ්‍රය ද භාවිත කෙරේ. ලක්දිව බෞද්ධ ගෘහ නිර්මාණ සම්ප්‍රදාය තුළ වැදගත් ඉදිකිරීම් විශේෂයක් වන පටිමාඝරයන්හි සැබෑ ඓතිහාසික වටිනාකම සම්බන්ධයෙන් නිවැරදි අවබෝධයක් ලබාගැනීමට මෙම අධ්‍යයනය ප්‍රයෝජනවත් වනු ඇත.

**ප්‍රමුඛ පද :** කැටයම්, පටිමාඝර, ප්‍රතිමා, වාස්තුවිද්‍යාව, සිතුවම්